ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

# තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 9 කාණ්ඩය 1 2012 ජුනි

# නව ලොවක අරුණ දකින අපේ පොඩි තේ වතු

දින දහයක සීමිත කාලයක් තුළ දිස්ත්‍රික්ක 8 ක් පුරා පැතිර ඇති තේ ඉඩම් 48 ක් නිරීක්ෂණයට අපට ලැබුණු රාජකාරිය එතරම් සුළු පටු දෙයක් නොවන බව අපට වැටහුනේ ගමනේ පළමුවෙනි දවසේදි ම ය. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සිරිල් මහත්මයත්, තිලක් ප්‍රනාන්දු මහත්මයත් සමඟ මා මේ බැරෑරුම් රාජකාරිය ආරම්භ කරන්න තීරණය කලේ රත්නපුර දිස්ත්‍රික්කයෙන්. උදෑසනින් ම ඇරඹුනු ගමනට රත්නපුරයේ දී ආරියපාල මහත්මයත් අප සමඟ එකතු වුනා.

පළමු නිරීක්ෂණය රත්නපුර කුරුවිට ප්‍රදේශයේ අක්කර හතරක පමණ තේ ඉඩමක්. TRI 4042 වගා කර විසිරි ජල සම්පාදන පද්ධතියක් සකස් කර තිබූ මේ ඉඩම තුළ පාංශු සංරක්ෂණ කටයුතු මනාව ස්ථාපනය කර තිබුණා. නිරන්තරයෙන් කාබනික ද්‍රව්‍ය පසට මිශ්‍ර කරමින් පස සරු කිරීමට ක්‍රියා මාර්ග ගෙන තිබුණු මේ ඉඩමේ අස්වැන්නත් අක්කරයකට මාසයකට අමු දළු කිලෝ ග්‍රෑම් 1100 ක් පමණ වුනා. අවශ්‍ය තොරතුරු ඉක්මනින් සටහන් කර ගත් අප ඉක්මනින්ම එම ඉඩමින් නික්මුනේ එදිනට තවත් ඉඩම් හතරක් නිරීක්ෂණය සඳහා ඉතිරිව තිබූ බැවිනි.



ජල සම්පාදන තාක්ෂණය:

ඉන් අනතුරුව කි. මී. 25 ක් පමණ ගෙවා කහවත්ත ඇන්දාන වත්ත මැදින් ගබ්බෙල දිමුතු මහත්මයාගෙ ඉඩමට අපි ලඟා වුනේ පැය 1 1/2 ක පමණ මගක් ගෙවා ගෙනය. අපගේ පොහොර අනුවර්ති පර්යේෂණයට විශාල දායකත්වයක් සපයන දිමුතු මහත්මයාගෙ ඉඩම අපට අළුත් තැනක් වුනේ නැහැ. ස්වෝත්සාහයෙන් දැනුම සොයා ගොස් නව තාක්ෂණය මුසු කරගත් වගාවක නිරත වෙලා සිටින දිමුතු මහත්මයා තේ වගාවට දී ඇති නිර්දේශ සියල්ල ඉතා ඉහළින් අනුගමනය කර ඇති බව අපට දැනුණා. ඔහුගේ වගා කටයුතු අතර අප දුටු සුවිශේෂම කටයුත්තක් වුයේ වාර්තා තබා ගැනීමයි. ඔහුම සකස් කර ගත් වාර්තා පොතක සියළුම ගණන් හිලවු, සිතියම්, වගා කටයුතු සටහන් කර තිබුණා. පායන කාලයට නිරන්තරයෙන් විසිරි ජල සම්පාදනය යෙදු නිසා කඳ පිළිකාවට වගාව ගොදුරු වෙලා තිබුනෙ නැහැ. ලාඩප්පා ගස් කළමණාකරනය හොඳින් සිදුකර තිබූ අතර අප නිර්දේශ කරන උසට වඩා වැඩි උසකින් ඔහු සෙවන ගස්වල වියන සකස් කර තිබුනේ ඉඩමේ විසිරි ජල සම්පාදන පද්ධතියට ගැටළුවක් නොවන ආකාරයටයි. ඔහු තේ වගාව සඳහා තාක්ෂණය භාවිතා කරන ආකාරයෙන් හා නව අත්හදා බැලීම් සිදු කරන ආකාරයෙන් ඔහු තුළ තරුණ තේ ගොවි විද්‍යාඥයෙකුගේ ලක්ෂණ හොඳින් මතුවී තිබුණා.

ඉන් අනතුරුව ගබ්බෙල කොලණිය හරහා අප උඩකරවිට තවත් ගොවි මහතෙකු හමුවීමට අපේ ගමන ඉක්මන් කළේ එදිනට නිමකළ යුතුව තිබුණු අපේ ඉලක්ක කෙසේ හෝ සපුරා ගැනීමේ තිර අදිටනින්. රත්නපුර කලවාන මාර්ගයේ උඩකරවිට පසුකරන විට හමුවූ දැඩි දුෂ්කර මාර්ගයක කි.මී. 5 ක් පමණ පසු කර අමරතුංග මහතාගේ ඉඩමට අප ළඟා වුයේ හිරු අවරට යාමට හෝරාවකට පමණ පෙරය. මාසික වැටුපක් හිමි කර දුන් ස්ථිර රැකියාවෙන් සමුගෙන අමරතුංග මහතා සහ ඔහුගේ බිරිඳ තේ වගාවට අවතීර්ණ වෙලා තිබුනේ දැඩි අවධානමක් ජිවිතයට එක්කර ගනිමින්, එහෙත් ඔවුන්ගේ නොපසුබට දිරිය ජීවිතයේ සියළු අවදානම් ජය ගන්න සමත් වෙලා තිබුණා. ගමේ අනෙකුත් තේ ගොවීන් සමඟ දැඩි සහයෝගයකින් කටයුතු කරන ඔහු "වැසි වනාන්තර සංධානය" නැමැති සංවිධානය සමඟ කටයුතු කරමින් පරිසර හිතකාමී තේ වගාවක් පවත්වා ගෙන යන අයුරු අපට දැක ගන්න ලැබුණා. නව දැනුම ලබා ගන්නටත් ඒ දැනුම ගොවීන් සමඟ බෙදා හදා ගැනීමටත් ඔහු දැක්වූ දැඩි උනන්දුව අප කණ්ඩායමේ අවධානයට යොමු වෙලා තිබුණා. අඳුරත් සමඟ ඔහුගේ නිවසින් අප සමුගත්තේ කොච්චි සම්බෝලයක් සමඟ ඔහු පිළිගැන්වූ මඤ්ඤොක්කා පිඟානක රස බැලීමෙන් අනතුරුවයි.

දැඩි වෙහෙසකර පළමු දිනයෙන් අප සමුගත්තේ හෙට අලුයම අප මුහුණ දිය යුතුව තිබුණු නව අභියෝග සිත තළ ගොනු කර ගනිමින්.

කුඩා තේ ගොවීන් ගැන කතා කරද්දි කඳුරට ප්‍රදේශය එතරම් ජනප්‍රිය මාතෘකාවක් නොවුනත් තේ කර්මාන්තයේ දැවැන්ත තෝරු මෝරු අතර සීතල කඳුකරය ජයගත් කුඩා තේ ගොවීන් සොයා ගෙන අපේ ගමන ඇරඹුනේ හිමිදිරි පාන්දර.

ගිනිගත්හේනේදී අපේ කණ්ඩායමට සම්බන්ධවුනු අධිකාරියේ උකුවෙල මහත්තය ඔහුගේ අවුරුදු හතලිහක රාජකාරී ගමනේ අවසන් රාජකාරිය ලෙස මේ ගමනට අප සමඟ සම්බන්ධ වීම, කුඩා තේ ගොවීන් පිළිබඳව ඔහුගේ සුවිසල් අත්දැකීම් විඳ ගන්නට අපට ලැබුණු අනගි අවස්ථාවක්ද වුණා.

ගිනිගත්හේනේ හෝමාගමින් ගමන් ඇරඹි අප කැළණිවත්ත පරීක්ෂා කිරීමෙන් අනතුරුව මස්කෙළිය හරහා හැටන් නගරයට පැමිණෙන විට දවසින් අඩක් නිමවෙලා තිබුණා. සමස්තයක් ලෙස අනෙක් ප්‍රදේශයන්ට සාපේක්ෂව එතරම් සාර්ථක කුඩා තේ ඉඩම් නුවරඑළිය දිස්ත්‍රික්කයේ දක්නට නොලැබුණු අතර ප්‍රදේශයට ඉතාමත් අත්‍යවශ්‍ය කටයුත්තක් ලෙස සැලකූ පාංශු සංරක්ෂණ කටයුතු පවා නිසි නිර්දේශයන්ට අනුකූලව සිදු කර ඇති බවක් අපට දක්නට ලැබුනෙ නැහැ. ලක්ෂපානත් නෝටන්බ්‍රිජ් නගරයත් අතර තේ ඉඩමකට පිවිසුණ මා හට පැරණි මතකයක් නැවත සිත තුළට කාන්දු වූ බවක් දැනුනු නිසා ඒ ඉඩම පිළිබඳ හොඳින් විපරම් කළා. මෙය මීට වසර 11 කට පමණ පෙර මුලින් ම හොඳම කුඩා තේ ඉඩම් තේරීම් තරගයේදී ජයග්‍රහණය කල ගොවි මහතාගේ ඉඩම බව මගේ මතකයේ අවදි වුණා. නැවත වසර ගණනාවකට පසුව ද හොඳම වගා කරුවෙකු සොයාගෙන ඒ ඉඩමටම යෑමට සිදුවීම අපගේ ව්‍යාප්ති සේවාවන්ගේ අඩුපාඩුවක්ද නොඑසේනම්

"ඔහුගේ වගා කටයුතු අතර අප දුටු සුවිශේෂම කටයුත්තක් වුයේ වාර්තා තබා ගැනීමයි. ඔහුම සකස් කර ගත් වාර්තා පොතක සියළුම ගණන් හිලවු, සිතියම් වගා කටයුතු සටහන් කර තිබුණා."

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

# තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 9 කාණ්ඩය 1 2012 ජුනි







සෙසු වගාකරුවන්ගේ දුර්වලතාවයක්ද යන්න අප අතර දැඩි සාකච්ඡාවකට භාජනය වුනා.

අපේ ඉතිහාසය තුළ රොබට් නොක්ස්ට නවාතැන් පලක් වූ ලැගුම්දෙණිය ප්‍රදේශයේ අතපත්තු මහත්මයාගේ ඉඩම මේ ප්‍රදේශයට සාපේක්ෂව හොඳ ඉඩමක් බව අපට නිරීක්ෂණය කළ හැකිවුණා.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කුඩා තේ ඉඩම් තුළ සඳහන් කළ හැකි සුවිශේෂ ලක්ෂණ දක්නට නොලැබුණු අතර පඳුරු දිරායාමේ තත්ත්වය නම් අවම මට්ටමක පැවතුණා. අපගේ නිරීක්ෂණ චාරිකාවේ තෙවන සහ සිව්වන දින ලෙස අප බදුල්ල බණ්ඩාරවෙල දිස්ත්‍රික්ක තෝරා ගත්තේ විශාල ප්‍රදේශයක් පුරා පැතිරුණු දුෂ්කර ගමනක් අපට යායුතුව තිබෙන බව පෙර අත්දැකීම් අනුව අපට දැනුන නිසයි.

හාලිඇල කන්දෙගෙදර ප්‍රදේශයෙන් ඇරඹුනු අපේ ගමන මීගහකිවුල හරහා පිටමාරුව දක්වා දිවෙන දුෂ්කර මාර්ගයකට අවතීර්ණ වුනා. අඩි 1,000 ක පමණ උච්චත්වයක සිට කි.මී 15 ක පමණ දුරකදී අඩි 3,900 ක පමණ උසක ඇති මඩොල්සිම, පිටමාරුව දක්වා ඒ දුෂ්කර මාර්ගය ඔස්සේ අප ළඟා වුණා. නව සංවර්ධනයේ අරුණලු බිඳක් ඒ දුෂ්කර ප්‍රදේශයට පතිත වී තිබුණත් දුප්පත් කමේ අඳුර බිඳ දමන්න එය ප්‍රමාණවත් වී තිබුනෙ නැහැ. පාසැල නිමවී කි.මී 5 ක් පමණ ගෙවා පිටමාරුවට එන දුලා පුතාලා කිහිප දෙනෙකුට පුංචි උදව්වක් කරන්න අපට හැකිවීමේ පුංචි සතුටක් අප කාගෙත් සිත් තුළට ඇතුළු කළා, "මාමේ අපේ තේ කෑල්ල මේ දවස්වල කුණු වෙලා හින්ද දලු නැහැ" කටකාර පැංචෙකුගේ මුවින් පිටවුනේ අප තේ වගාවට සම්බන්ධ කණ්ඩායමක් බව දැනගත් නිසායි. දහවල් කාලයේදීත් මේ ප්‍රදේශය පුරා පැතිරුණු මීදුම අපට පැවසුවේ මේ තේ කුණුවීමේ චූදිතයා සුදු බුබුළු අංගමාරය බවය.



බදුල්ල දිස්ත්‍රික්කයේ වැඩිපුරම දක්නට ලැබුණේ TRI 2025 තේ පඳුරුවල සැකිල්ලේ පැතිරීම හොඳ තත්ත්වයක තිබුණු අතර කඳ දිරායාම අවම තත්ත්වයක පැවතුනා. සෙවන වගාවේ අවශ්‍යතාවය ඉතාමත් තදින් දැනුනත් නිවැරදිව ස්ථාපනය වූ සෙවන දක්නට ලැබුණේ ඉතාමත් අඩුවෙන් ය. උස සෙවන ලෙස ග්‍රැවිලියා වගාකර තිබුනත් ඒවා නියම ආකාරයට කළමණාකරනය කර ඇති බවක් අප දුටුවේ නැහැ.

තේ වගාවේ සාම්ප්‍රදායික වගා ක්‍රම අනුගමනය කිරීමෙන් පමණක් නොනැවතී දිගු කලක් පුරා තේ වගාවේ නියැලීමෙන් ලැබූ අත්දැකීම් භාවිතයෙන් විවිධ අත්හදා බැලීම් සිදු කරන කුඩා තේ වතු හිමියෙකු අපට හපුතලේ ප්‍රදේශයේදී මුණ ගැසුනා. මින් පෙර වසරක දිස්ත්‍රික්කයේ හොඳම තේ ගොවි සම්මානයට හිමිකම් කියූ ඔහු ආරියසේන මහතාය. තේ ඉඩමට පොහොර ලෙස යොදා ගත හැකි විවිධ කොළ පොහොර



**අතුරුභෝග විවිධත්වය**

ශාක පිළිබඳ සොයා බැලීමත් දේශීය ද්‍රව්‍ය භාවිතයෙන් නිපදවන, තේ වගාවන්ට යෙදිය හැකි විවිධ දියර පොහොර මිශ්‍රණ සාදා ගන්නා ආකාරයත් ඔහු විසින් අපට පෙන්වා දුන්නා.

අපගේ නිරීක්ෂණ චාරිකාවේ පස්වන දිනය වෙන් වුනේ මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කයන්ට. මෙම දිස්ත්‍රික්කයන්හි අවසන් වටයට තේරී තිබුණු බොහෝ ඉඩම්වල දක්නට ලැබුණු තේ ප්‍රභේදයන් TRI 2023 සහ TRI 2025 බව අප නිරීක්ෂණය කළ අතර වත්තේගම අබේසිංහ මහත්මයා නව ප්‍රභේද වගා කිරීමට උනන්දුවක් සහ දැඩි උත්සාහයක් ගෙන තිබූ බව අප දුටුවා.

බොහෝ ඉඩම්වල ගම්මිරිස් කරාබු වැනි අතුරුබෝග තේ අතර වගා කර තිබූ අතර සමහර ඉඩම්වල තේ වගාවට වඩා වැඩි අවධානයක් අතුරු බෝගයන්ට දක්වන බව පැහැදිලිව පෙනුනා. වත්තේගම වෑගොඩපොල මහතා තේ වගාවට යොමුවෙලා තිබුනෙ වසර ගණනාවක් එළවළු ගොවියෙකු ලෙස ලබාගත් අමිහිරි අත්දැකීම් රැසක් එකතු කර ගෙන. නමුත් තේ වගා ක්ෂේත්‍රය ඔහුට එකතු කර දී තිබුනෙ ඉතාමත් සුභවාදී මෙන්ම මිහිරි අත්දැකීම් බව අපට ඔහුගේ කතාවෙන් වැටහුනා. TRI 2023 වගා කර තිබූ ඔහුගේ ඉඩමේ අක්කරයකින් මාසයකට අමු දළු කිලෝ දාහක් අභිබවා යන්න ඔහුට එතරම් අපහසු වුනේ නැහැ. ඔහුගේ මුවෙන් ගිලිහී ක්ෂණිකව අපගේ සටහන් පොතේ පිටු අතරට එක්වුනු තවත් වැදගත් තොරතුරක් වුයේ ඔහුගේ ඉඩමේ නිෂ්පාදන වියදම ය. ඔහුට අමුදළු කිලෝවක් නිපදවීමට වැයවන්නේ රුපියල් 15-18 අතර මුදලක් බව සඳහන් කළ විට එය අපට විමතියට කරුණක් නොවුනේ ඔහුගේ ඉඩමේ සරුසාරබව සහ නිවැරදි කළමණාකරනය අපගේ දෑස් ඉදිරිපිට විද්‍යමාන වූ බැවිනි. තේ පඳුරු අතරින් මතුවී ස්තම්භයන් සේ ඉහළට නැගි ගම්මිරිස් වැල් සහිත ග්ලිරිසීඩියා ගස්, තේ වගාවට අමතරව ඔහුගේ අතමිට සරු කළ තවත් සම්පතක් බව අපට වැටහුනා.

වටිනා දැව වර්ග ඖෂධ ශාක, පළතුරු ගස්, කොස්, දෙල් මෙකී නොකී තුරුලතාවන්ගේ විවිධත්වයෙන් ගොඩ නැගුනු පරිසරයකට හිමිකම් කියන කෑගලු දිස්ත්‍රික්කය පුරා අප සයවන දිනයේ චාරිකා කළා. ඉහළ



**උස් සෙවන කලමණාකරනය**

ආදායමක් ලබා දෙන සරු තේ ඉඩම් මේ ප්‍රදේශයේදී අපට නිරීක්ෂණය

6 පිටුවට

**ධර්මප්‍රිය සමන්සිරි**

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA 1925

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

# තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 9 කාණ්ඩය 1 2012 ජුනි

කළ හැකි වුවත් නිර්දේශිත වගාක්‍රම ප්‍රශස්ථ ලෙස යොදා ගෙන ඇති බවක් අපට එතරම් හොඳින් දක්නට ලැබුනේ නැහැ. දිවයිනේ අනෙක් ප්‍රදේශයන් හි තේ ගොවීන් මුහුණදෙන නියඟයේ අමිහිරි අත්දැකීම්, ස්වභාව ධර්මය විසින් කෑගලු තේ ගොවීන්ට ලබා දී ඇති බවක් අපට දක්නට ලැබුනේ නැහැ. අක්කර 10 ක පමණ තේ ඉඩමකට එකතු කළ අප්‍රතිහත ධෛර්යයත් උනන්දුවත් තුළින් කුඩා තේ ගොවියෙකු සාර්ථක ව්‍යවසායකයෙකු බවට පත් කළ හැකි බව නිව්ටන් සෝමරත්න මහත්මයා අපට ඔප්පු කර පෙන්නුවා. රැකියාවත්, ජීවන මාර්ගයත්, විනෝදාංශයත් තේ වගාවම කරගත් මිනිසෙකු අද දවසේ ලබා ඇති සාර්ථකත්වය ගැන අප විමතියට පත්වුනේ නැහැ.

සති අන්තයේ ලැබූ එක් දිනක විරාමයෙන් පසු අප නිරීක්ෂණ චාරිකාවේ ඉතිරි කොටස මාතර දිස්ත්‍රික්කයෙන් ආරම්භ කළා. අවසන් වටයට තේරී තිබුණු ගොවීන් සියළු දෙනාම ඉහලම තත්ත්වයක සිටි නිසා දිස්ත්‍රික්කයේ හොඳම කුඩා තේ වතු හිමියා තෝරාගැනීම අපට විශාල අභියෝගයක් වුනා. මධ්‍යම සෙවන ලෙස ලාඩප්පා වගාකර ඒවා හොඳින් කළමණාකරනය කිරීම මේ හැම වගාවකම අපට නිරීක්ෂණය කළ හැකි වූ නමුත් උස් සෙවන ලෙස වගා කර තිබූ ඇල්බීසියා පරතරයන් සහ කළමණාකරනය ගැන අපට එතරම් සතුටුවිය හැකි වුනේ නැහැ. භාවිතාකර තිබූ පාංශු සංරක්ෂණ ක්‍රම පිළිබඳ අපට සෑහීමට පත්විය හැකි වුවත් ඒවා කළමණාකරනය පිළිබඳ ඔවුනට තවත් ඉගෙන ගත යුතු දෑ බොහෝ තිබෙන බව අපට වැටහුනා. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම, අපට හමුවූ මේ සියළු තරඟකරුවන් ප්‍රගාමී කුඩා තේ වතු හිමියන් වූ අතර බොහෝ දෙනෙකු නව තේ ප්‍රභේද වගා කිරිමට උනන්දුවක් දක්වා තිබුණා.



කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහ තේ පර්යේෂණ ආයතනයේ නිරන්තර උපදෙස් පිළිපදිමින්....

දිගු කාලයක් පුරා ගොඩ නැගූ සහ නව්‍ය තාක්ෂණය භාවිතයට නැඹුරුවක් දැක්වූ මෙන් ම තේ වගා නිර්දේශයන්ට බොහෝ දුරට අනුගත වූ, කුරුඳුවත්ත නැමති ඉඩම සමඟ මෑතදී තේ වගාවට අවතීර්ණ වී සාර්ථක වගාවක් පවත්වාගෙන යන ගුණවර්ධන මහත්මයාගේ ඉඩම හොඳ තරඟයක් ලබා දී තිබුණ. ඒ වුවත් කටුක පරිසරයක දැඩි උනදුවකින් බිඳිති ජල සම්පාදනය, නව තේ ප්‍රභේද සහිතව හොඳ සෙවන කළමණාකරනයක් සහිත ගුණවර්ධන මහත්මයාගේ ඉඩමට තරමක් ඉදිරියට ඒමට හැකියාව ලැබුණ.

සමස්තයක් ලෙස හොඳින් සෙවන ස්ථාපනය කළ, පාංශු සංරක්ෂණ ක්‍රම හොඳින් භාවිතා කළ, නව තේ ප්‍රභේදයන්ට සැලකිය යුතු ප්‍රමුඛත්වයක් දෙන ඉහළ අස්වැන්නක් ලබා ගන්නා තේ වගාකරුවන් රැසක් මාතර දිස්ත්‍රික්කය තුළ අපට නිරීක්ෂණය කළ හැකිවූ අතර එයින් කිහිපදෙනෙකු හොඳ තේ ව්‍යවසායකයන් ලෙස හඳුනා ගැනීමටත් අපට හැකි වුණා.

එක දවසක් තුළ මාතර දිස්ත්‍රික්කය පුරා සංචාරය කර දැඩි වෙහෙසකර දවසකට පසු අප යොදාගෙන තිබුනේ තවත් එවැනිම වැදගත් මෙන් ම තේ වගාවේ ප්‍රධාන දිස්ත්‍රික්කයක්. ඒ ගාල්ල දිස්ත්‍රික්කය. මාතර දිස්ත්‍රික්කය මෙන්ම ගාල්ල ද කුඩා තේ වතු අංශයෙන් ජාතික තේ ආර්ථිකයට ඉහළ දායකත්වයක් දක්වන දිස්ත්‍රික්කයක්. මෙම දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු බහුතරයක් මනා කළමනාකාරීත්වයක් සහ සැලකිය යුතු ඵලදායිතා මට්ටමක් පෙන්වන බව අපට සක්සුදක් සේ පැහැදිළි වුණා. තෝරාගෙන තිබූ තරඟ කරුවන් හයදෙනා අතර නැගී එන තරුණ තේ ව්‍යවසායකයන් කිහිප දෙනෙකු හඳුනා ගැනීමට අපට හැකි වුණා. මේ ඉඩම් අතරින් "තේ වගා පාසැලක්" බඳුවූ බටපොල සුසන්ත සිල්වා මහතාගේ ඉඩම සහ උස් සෙවන මනා ලෙස ස්ථාපනය කර කළමණාකරනය කර තිබූ උනන්විටියේ කමලබන්දු මහතාගේ තේ ඉඩම අපගේ විශේෂ අවධානයට යොමුවුණා. කුඩා තේ ඉඩම්වල උස් සෙවන සාර්ථකව පවත්වාගෙන යා නොහැකිය යන මතය පැහැදිලිවම පරාජය කිරීමට කමලබන්දු මහතාට හැකිවී තිබුණා.

සංචාරයේ අවසන් කොටස නිම කිරීමට ගාල්ල දිස්ත්‍රික්කයෙන් සමුගෙන කළුතර දිස්ත්‍රික්කයට අප පැමිණියේ පසු දින හිරු කිරණ මිහිතලය සිප ගැනීමටත් පෙරාතුවයි. ඉහළ ඵලදායිතාවයක් සහිත කුඩා තේ ඉඩම් දක්නට ලැබෙන කළුතර දිස්ත්‍රික්කය, තේ කර්මාන්තයට ඇති නව බලාපොරොත්තුවක් ලෙස අපට හඳුන්වන්න පුළුවන්. ඒ බලාපොරොත්තුවේ අපේක්ෂා මල් ඵල ගැන්වීමට අප එන පෙර මඟ බලා සිටි කුඩා තේ ගොවීන් හය දෙනෙකු කළුතර දිස්ත්‍රික්කය තුළ සූදානම්ව සිටියා. මාතර, ගාල්ල දිස්ත්‍රික්ක තුළ තරම් විධිමත්ව වගා කටයුතු කර නොතිබුනත් සෙවන වගාවට නිසි තැන දී ඇති බව අප තේරුම් ගත්තා. කෙසේ නමුත් නොදැනුවත්ව අනුගමනය කර තිබූ සමහර වැරදි වගා ක්‍රම නිසා පඳුරු දිරා යාම බහුලව සිදුවී ඇති බව අප බොහෝ තේ ඉඩම් තුළ නිරීක්ෂණය කළා. නැගී එන තරුණ තේ ව්‍යවසායකු කළුතර දිස්ත්‍රික්කය තුළින් හඳුනා ගැනීමට අපට හැකිවීම කුඩා තේ වතු ක්ෂේත්‍රය දෙස නව ආකල්පයකින් බැලීමට අපට මඟ හෙළිකර දුන්නා.

කළුතර දිස්ත්‍රික්කයට නව අරුණැල්ලක් වූ 'අරුණ' විදේශ රටකින් උසස් අධ්‍යාපනය ලැබ එහි ඵල අපේ රටේ මිනිසුන් සමඟ බෙදා හදා ගැනීමට තේ වගා කටයුතු කළ තම පියා සමඟ අත්වැල් බැඳගෙන තිබුණා. නව තේ ප්‍රභේද, තේ පඳුරු අතර විධිමත්ව වගා කළ පොල්, මධ්‍යම සෙවන ලෙස ග්ලිරිසීඩියා, තේ පඳුරු අතර මී මැසි ජනපද, තේ ඉඩමට නිරන්තරව ජල සම්පාදනය කරන විසිරී ජල සම්පාදන පද්ධතිය තේ වගාව වර්ණවත් කළ අතර ගොවිපොලේ ඉතිරි ඉඩකඩ තේ තවානකට, පලතුරු සහ එළවළු වගාවන්ට සහ සත්ත්ව පාලනයට වෙන් කර තිබුණා. ඩ්‍රැගන්ෆෘට් වැනි නව පලතුරු වර්ග, පුවක් බඩ වැටි, කැවෙන්ඩිෂ් වැනි නව කෙසෙල් වර්ග ඉඩමේ සුදුසු පරිදි වගා කර තිබීම අප හොඳින් නිරීක්ෂණය කළ තවත් විශේෂ තත්ත්වයක් වුණා. වගා කටයුතු පහසුවෙන් කිරීමට කුඩා ප්‍රමාණයේ 'බැක් හෝ' යන්ත්‍ර භාවිතා කළ බවත් ඉඩමේම පිළියෙල කරගත් කොම්පෝස්ට් නිරතුරුව වගාවන්ට යොදන බවත් අප දුටුවා.

අරුණගේ උත්සාහයටත් ඉදිරි ගමනටත් සුභ පතමින් අප ඔවුන්ගෙන් සමුගත්තේ කුඩා තේ ක්ෂේත්‍රය තුළ ඉදිරියේ දී දැකිය හැකි නව ගමනක සුබ සිහින සිත තුළ රඳවා ගනිමිනි.

**නිවැරදි කිරිමයි**

පසු ගිය තේ තතු කලාපයේ (වෙළුම 08 කණ්ඩය 02) ඇතැම් මුද්‍රණයන්හි "වතු සේවක වැටුප් ඉහළ යාම කුඩා තේ වතු හිමියාට බලපායිද ? " මැයෙන් වූ ලිපියෙහි, ප්‍රමාද දෝශයක් නිසා **නිමංකා කේ වෙල්ලාල** යන ලේඛිකාවගේ නම මුද්‍රණය වී නොතිබිණි. එම ලිපියේ දෙවන ලෙඛිකාව ලෙස ඇගේ නම ඇතුළත් විය යුතු අතර ඒ පිළිබඳ අපගේ කණගාටුව ප්‍රකාශ කරමු. - සංස්කාරක